DOI: 10.31357/fhssphd.2014.00070

# අවලෝකිතේශ්වර සංකල්පය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් - ශ්‍රී ලංකාව හා ජපානය ඇසුරෙන්

වෙඩික්කාර නිමල් ඉන්ද්‍රසිරි සේනාරත්න

04 AUG 2014

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දර්ශනසූරි උපාධි පරීක්ෂණය සඳහා බෞද්ධ ශිෂ්ටාචාරය විෂය යටතේ ඉදිරිපත් කෙරෙන නිබන්ධය.

# අපේක්ෂකයාගේ ප්‍රකාශය

මේ ශාස්ත්‍රීය නිබන්ධය ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන්ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, 2014. 06. 27 වන දින පැවති වාචික පරීක්ෂණයේ දී පරීක්ෂක මණ්ඩලය විසින් පෙන්වා දුන් සංශෝධනයන් නිවැරදි කර, නිබන්ධය PDF ආකාරයට නැවත සකස්කළ CD තැටියක් ද සමඟ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට භාර දෙමි.

..............................................

දිනය 30-07-2014

වෙඩික්කාර නිමල් ඉන්ද්‍රසිරි සේනාරත්න

1304 HU2010003

## උපදේශක හිමිපාණන්ගේ ප්‍රකාශය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, 2014. 06. 27 වන දින පැවති වාචික පරීක්ෂණයේ දී පරීක්ෂක මණ්ඩලය විසින් පෙන්වා දුන් සංශෝධනයන් නිවැරදි කර ඇති බවත්, සංශෝධිත නිබන්ධය දර්ශනසූරී උපාධි ප්‍රදානයට ඉතාමත් සුදුසු බවත්, නිර්දේශ කරමි.

.....................................

දිනය 30.07.2014 ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමි

මහාචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමි
අධ්‍යයනාංශ ප්‍රධාන
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

# පටුන


පිටුව

ස්තුති ප්‍රණාමය iv-v

සංකේත නිරූපනය vi-vii

නිබන්ධ සාරාංශය viii-ix

**පළමු වන පරිච්ඡේදය**

Kannon / අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව සංකල්ප 10-23

1.1 හැඳින්වීම 10-11

1.2 නිර්වචන විග්‍රහය 11-23

**දෙ වන පරිච්ඡේදය**

ජපානයේ Kannon /අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව භක්තියට පදනම දැමූ සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය 24-60

2.1 ප්‍රවේශය 24-28

2.2 ජපානයේ පවතින පිළිගැනීමේ ස්වභාවය 28-37

2.3 සංස්කෘත ග්‍රන්තයේ 24වන පරිච්ඡේදය 38-38

2.4 ජපන් අර්ථ කථන සහිත 24වන පරිච්ඡේදය 39-39

2.5 සිංහල පරිවර්තනය 40-47

2.6 බෝධිචර්යාවතාරයේ විස්තරය 48-49

2.7 සුඛාවතී ව්‍යූහය සූත්‍රයේ විස්තරය 50-58

2.8 මංජුශ්‍රී භාෂිත චිත්‍රකර්ම ශාස්ත්‍රයේ විස්තර 59-60

**තුන් වන පරිච්ඡේදය**


| | | |
|---|---|---|
| අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව සංකල්පයේ ආරම්භය,<br>ව්‍යාප්තිය හා බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණ | | 61-161 |
| 3.1 | අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව සංකල්පයේ දේශාන්තර ව්‍යාප්තිය | 61-112 |
| 3.1.i | හැඳින්වීම | 61-63 |
| 3.1.ii | රාජ්‍ය අනුග්‍රහය | 63-71 |
| 3.1.iii | Kannon භක්තියට පදනම සකස් වීම | 72-73 |
| 3.1.iv | අභියෝග හා විසඳුම් | 73-94 |
| 3.1.v | ශ්‍රී ලංකාවේ හා ජපානයේ භූගෝලීය පරිසරය | 94- 98 |
| 3.1.vi | Kannon විහාරයක ව්‍යුහය | 99-112 |
| 3.2 | බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණ කලාවේ විකාශය | 113-161 |
| 3.2.i | ජපන් අවලෝකිතේශ්වර බෝධිසත්ත්වවරුන් හා එම ප්‍රතිමාවන් | 113-139 |
| 3.2.ii | අවලෝකිතේශ්වර පාරාදීසය | 139-141 |
| 3.2.iii | ස්ත්‍රීවාචී කලාවිචාරය | 142-145 |
| 3.2.iv | Jyu - ichi - men අවලෝකිතේශ්වර ප්‍රතිමාවේ විශේෂතා | 146-148 |
| 3.2.v | ශ්‍රී ලංකාවේ අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව වන්දනාව හා ප්‍රතිමා | 149-155 |
| 3.2.vi | සංස්කෘත භාෂා මූලාක්ෂර | 156-161 |


**හතර වන පරිච්ඡේදය**


| | | |
|---|---|---|
| ප්‍රතිමා හා මූර්ති ශිල්පීය තාක්ෂණයේ ඇතිකළ නව ප්‍රබෝධය | | 162-209 |
| 4.1 | හැඳින්වීම | 162-165 |

4.2 ශිල්පීය තාක්ෂණයේ පදනම 165-168

4.3 ශ්‍රී ලංකාව හා ජපානය 168-170

4.4 ප්‍රතිමා නිර්මාණ තාක්ෂණවේදය 170-185

4.5 කලා නිර්මාණ විවිධතා 186-189

4.6 ප්‍රතිමා හා මූර්ති ශිල්පයේ විවිධතා 190-192

4.7 අද්‍යතන ජන සමාජ 193-195

4.8 වර්තමාන ප්‍රවණතා 195-196

4.9 ජනවිඥානය කෙරෙහි ඇති වන බලපෑම් 197-205

4.10 ප්‍රශ්නාවලිය 206-207

4.11 ප්‍රශ්නාවලී මූලාශ්‍ර හා නිගමන 208-209

**පස් වන පරිච්ඡේදය**

නිගමන 210-212

ඇමුණුම් 213-262

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 263-272

# ස්තුති ප්‍රණාමය

ඉහත තේමාව යටතේ වසර තුනක කාල වකවානුව තුළ ජපානයේදී හා ශ්‍රී ලංකාවේදී කරන ලද මෙම පර්යේෂණ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා මූලික උපදෙස් දෙමින්, සෑම වචනයක් ම ධෛර්යවන්ත වන සේ හවිත කරමින්, විද්වද්ජන පරිශ්‍රයට මා යොමු කළ, මාගේ ප්‍රධාන පරීක්ෂක වශයෙන් කටයුතු කරන ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශාධිපති ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන් වහන්සේට මා පළමු කොටම ගෞරව පූර්වක ගුරු භක්තියෙන් යුතුව ස්තුති ප්‍රණාමය පුද කරමි.

යෝග්‍යතා සම්මන්ත්‍රණය පැවැත්වීමේ දී එතෙක් මා තුළ පැවති උද්‍යෝගය දෙ ගුණ තෙ ගුණ කර සංශෝධනය කළයුතු කොටස් පෙන්වා දී, නව මං හෙළි කර දුන්, එවක විද්වද් සභාවේ සභාපති ලෙස කටයුතු කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කුලපති මහාචාර්ය ගරු බෙල්ලන්විල විමලරතන නාහිමිපාණන් වහන්සේ ඇතුළු සාමාජික විද්වතුන්ටත්,

සුවිශේෂ ලෙස පොත් පත් පරිශීලනයට අවස්ථාව ලබාදුන් දෙහිවල හා කොළඹ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන විධායක අධ්‍යක්ෂ ගරු කිරම විමලජෝති නාහිමිපාණන් වහන්සේටත්, පුරා වසර දෙකක් විදේශීය අධ්‍යයන නිවාඩු ලබාදුන් කොළඹ රාජකීය විදුහල්පති උපාලි ගුණසේකර මහතා හා උප විදුහල්පති සරත් කීර්තිසේන මහතාටත්, ශාස්ත්‍රීය ග්‍රන්ථ රැසක් සපයා දුන් විදුහල්පති සේවයේ කොළඹ රාජකීය විද්‍යාලයේ ආචාර්යවරයකු වන එම්. කේ. දයාවංශ මහතාටත්, නිරන්තරයෙන් ම අවශ්‍ය උපදෙස් ලබාදුන් පශ්චාත් උපාධි පීඨයේ තුෂාර මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ජපානයේ ක්ෂේත්‍ර පර්යේෂණ කාර්යයන් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදුන් Gembi Takeishi Sensei හා Ryuji Yokoyama Sensei යන නා හිමි වරුන්ටත්,

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පුස්තකාලය, කැලණිය විශ්ව විද්‍යාලයේ පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය, මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුස්තකාලය, පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ පුස්තකාලය හා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පුස්තකාලය ඇතුළු ව එහි සියලු ම පුස්තකාලයාධිපතිවරුන් හා නිළධාරීන්ටත්, පරිශීලනයට අවශ්‍ය ඉපැරණි ලේඛන රැසක් සපයා දුන් කැලණිය විශ්ව විද්‍යාලයේ සහ ශ්‍රී ලංකා බෞද්ධ සහ පාලි විශ්ව විද්‍යාලයේ විශ්‍රාමලත් ලේඛකාධිකාරිවරයකු වූ ඩබ්ලිව්. ඩී. තිසේරා මහතාටත්, ඉපැරණි ජපන් භාෂා ග්‍රන්ථ පරිශීලනය කිරීමේ දී මතු වූ ගැටළු විසඳා ගැනීමට උපදෙස් දුන් ජපන් භාෂා විශේෂඥයන් වූ Hiroko Ninomiya Sensei හා Hiroshi Ishiyama Sensei ටත්,

ඉපැරණි අවලෝකිතේශ්වර ප්‍රතිමා හා පැරණි ලේඛන විමර්ෂණය කිරීමට කාරුණික ව අවස්ථාව සලසා දුන් Tokyo ජාතික කෞතුකාගාරයේ අධ්‍යක්ෂතුමා ඇතුළු නිළධාරීන්ටත්, Tokyo හි Nerima හා Shibuya නාගරික පුස්තකාලය, Kanagawa ප්‍රාන්තයේ Kamakura නාගරික

පුස්තකාලය, Chiba ප්‍රාන්තයේ Kashiwa හා Naritha යන නාගරික පුස්තකාලවල නිළධාරීන්ටත්, Asahi Kokusai Gakuen ජාත්‍යන්තර විදුහල්පති හා Horinkai ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ උප සභාපති Omori Takeshi Sensei ටත්,

චීන භාෂා හා ජපන් භාෂා පරිවර්තන ග්‍රන්ථවල ඇති පරස්පර විරෝධී ගැටළු විසඳා ගැනීමට සහය දුන් චීන හා ජපන් භාෂා විශාරදයෙකු වූ Shanghai නුවර Wang Lin මහතාටත්,

පරිශීලනය කළ පොත්පත්වල කරුණු විශ්ලේෂණය කර සම්පිණ්ඩනය කරමින් සිටින විටදී අවශ්‍ය පරිසරය සකසා දී පරිගණක කටයුතු කර දුන් දුව භාග්‍යා හා පුතා නිකිතටත් මාගේ ස්තූති ප්‍රණාමය හිමි වේ.

## සංකේත නිරූපනය

| | |
|---|---|
| APSD | A Practical Sanskrit Dictionary |
| ASCD H.O.C.E. | ASCA Horin Overseas Cultural Exchange |
| බෞ. සං. ම. | බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය දෙහිවල |
| DDB | Digital Dictionary of Buddhism |
| ජා. කෞ. දෙ. | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව |
| HTK | Hasedera Temple Kamakura |
| HTN | Hasedera Temple Nara |
| JAANUS | Japanese Architecture and Art Net Users System |
| JCBRAS | Journal of the Ceylon Branch of the Royal Asiatic Society, Colombo |
| JRASGBIL | Journal of the Royal Asiatic Society of Great Britain and Ireland, London |
| K.I. | Kodansha International |
| KTK | Kyomizudera Temple Kyoto |
| මං. භා. චි. | මංජුශ්‍රී භාෂිත චිත්‍රකර්ම ශාස්ත්‍රය |
| NBAT | Nara Buddhist Art, Todai-ji |
| PGIAR | Post Graduate Istitute of Archeology |
| PTS | Pali Text Society |
| ප්‍ර. පා. සූ. | ප්‍රඥා පාරමිතා සූත්‍ර |
| පු. දෙ. | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| STN | Saidai-ji Temple Nara |

| | |
|---|---|
| ස. පු. සූ. | සද්ධර්මපුණ්ඩරී සූත්‍රය |
| ස.හ.ස.හ.නේ.අැ.බෝ. | සහශ්‍රහස්ත සහශ්‍රනේත්‍ර අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව |
| ශ්‍රී.ලං.ලෝ.මු.ක.උ. | ශ්‍රී ලංකා ලෝකඩ මූර්ති කලා උරුමය |
| සු.සූ. | සුඛාවතී සූත්‍රය |
| TATEAB | Thousand Arms Thousand Eyes Avalokitesvara Bodhisattva |
| TTN | Todai-ji Temple Nara |
| WSCP | World Sanctuary Construction Project |

## අවලෝකිතේශ්වර සංකල්පය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් - ශ්‍රී ලංකාව හා ජපානය ඇසුරෙන්


### නිබන්ධ සාරාංශය

පරිච්ඡේද පහකින් යුත් මෙම පර්යේෂණ නිබන්ධයේ පළමු වන පරිච්ඡේදයෙන් අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් පිළිබඳ හැඳින්වීම හා අර්ථ විග්‍රහය ඉදිරිපත් කෙරේ. මෙම අර්ථ විග්‍රහය හා විමර්ශනය තුළින් එතෙක් පැවති ඇතැම් අර්ථකථනවල සදොස් යැයි හැඟුණ තැන් නිවැරදි කිරීමට ද අවස්ථාව ලැබිණ.

දෙ වන පරිච්ඡේදයේ දී ජපානයේ අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව සංකල්පයට පදනම දැමූ මහායාන සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය පිළිබඳ විග්‍රහයක් ද එම සූත්‍රය පිළිබඳ ජපන් ජනතාවගේ පිළිගැනීමේ ස්වරූපය ද සාකච්ඡා කෙළෙමි. සිංහල, සංස්කෘත, හා ජපන් යන භාෂා තුනකින් යුතුව ඇති සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ අර්ථවිග්‍රහයන් දෙස බලන විට හෙළි වන ඇතැම් වෙනස්කම් ගැනත් විමර්ශනය කෙළෙමි. මෙහි 24 හි 25 පරිච්ඡේද ද ඇතුළත් කර ඇත. ඒ සමගම ජපානයේ මහත් පිළිගැනීමක් ඇති සුඛාවතී ව්‍යූහ හා ප්‍රඥා පාරමිතා සූත්‍රවලත් බෝධිචර්යාවතාරයේ මෙම බෝධිසත්ත්වයන් ගැන ඉගැන්වෙන මූලික කරුණුත්, අනතුරුව බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණය ගැන මංජු ශ්‍රී භාෂිත චිත්‍ර කර්ම ශාස්ත්‍රයේ සඳහන් වන මූලික කරුණුත් උපුටා දක්වා එම ක්ෂේත්‍රය ගැනද ජපානය හා සසඳමින් විමර්ශනයට භාජනය කෙළෙමි.

තුන් වන පරිච්ඡේදය යටතේ, බුදුසමය ජපානයට හඳුන්වා දුන් ආකාරයත්, ඒ සමගම අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව සංකල්පය, භක්ති මාර්ගයක් ලෙස ජපානය පුරා ව්‍යාප්ත වී ගිය ආකාරයත්, එහි ව්‍යාප්තියේදී අභියෝග හා විසඳුම් ලැබුණ ආකාරයත්, සාකච්ඡා කෙළෙමි. ශ්‍රී ලංකාවේ ඇදහිලි ක්‍රමයක් ලෙස පැහැදිලිව ම දැකගත හැකි වූ පැතිකඩ දෙකක් දෙස ද අවධානය යොමු කර ඇත.

හතර වන පරිච්ඡේදය යටතේ අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණය හා එහි තාක්ෂණවේදය කෙරෙහි අවධානය යොමු කරමින් ජාතික සංස්කෘතික උරුම රැසක් ලොවට දායාද කර තබන්නට දෙ රටේම කලා කරුවන් මෙහෙය වූ ආකාරය සෙවීමට ද උත්සාහ කෙළෙමි. දෙරටෙහි ම විද්වතුන් අතර මේ සම්බන්ධයෙන් ඇති ගැටළු පිළිබඳවත්, ස්ත්‍රී වාචී කලා විචාරය පිළිබඳවත් සාකච්ඡා කිරීමට අවස්ථාව සළසා ගත් අතර ක්‍රමවේදයක් ලෙස අනුගමනය කළ ප්‍රශ්නාවලිය හා එහිදී ලැබුණ ප්‍රබුද්ධ ප්‍රතිචාරයත් දෙ රටේම ජනශ්‍රැති තුළින් දෙරටේම ජන විඥානය කෙරෙහි ඇති කරන බලපෑම් ගැනත් සාකච්ඡා කෙළෙමි. එසේම ශ්‍රී ලංකාවේ අවලොකිතේශ්වර බෝධිසත්ත්ව සංකල්පය නාවිකයන් ආරක්ෂා කිරීමේ හා රෝගීන් සුවපත් කිරීමේ විශ්වාසය වෙත නැඹුරු වූ ආකාරය ද ජපානයේ එය

ආශ්‍රිත සම විසමතා ද විමර්ශනයට භාජනය වීය. ප්‍රතිමා නිර්මාණයෙහිලා බලපෑ දෙරටේම භූගෝලීය පරිසරයත්, දේශීය චින්තන විධි ගැනත්, අවධානය යොමු කර ඇත. මෙම සංකල්පය දෙස අද්‍යතන ප්‍රබුද්ධ ජන සමාජය, පොදු ජන භක්ති මාර්ගයකටත් වඩා ඉහළ උද්යෝගයකින් බලන ආකාරය ගැනත් අවධානය යොමු කෙළෙමි.

පස් වන පරිච්ඡේදය යටතේ නිගමන හා සමාලෝචනය ඉදිරිපත් කොට ඇත.

# පළමු වන පරිච්ඡේදය

## KANNON - අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් පිළිබඳ නිර්වචන විග්‍රහය

### හැඳින්වීම

පොදුවේ ථේරවාද හා මහායාන සම්ප්‍රදාය දෙකෙහි ම බෝධිසත්ත්ව සංකල්පය හඳුනාගත හැකි වුව ද , මහායාන සම්ප්‍රදායයේ බෝධිසත්ත්ව සංකල්පයට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. බෝධිසත්ත්ව සංකල්පය බෞද්ධ චින්තනයේ කේන්ද්‍රීය සංකල්පයක් ලෙස ද හඳුන්වා ඇත.[1 A]

ආගමික විශ්වාස පදනම් කරගත් ඇදහිල්ලක් වශයෙනුත්, දර්ශනයක් වශයෙනුත් මහායාන සම්ප්‍රදායය ථේරවාදී සම්ප්‍රදායයට වඩා විශාල වෙනසක් හා වර්ධනයක් පෙන්නුම් කරයි. මහායාන බෞද්ධ දර්ශනයේ ව්‍යාප්ත ව ගිය බෝධිසත්ත්ව සංකල්පය තුළ බෝධිසත්ත්වවරු විශාල පිරිසක් හඳුන්වා දෙනු ලබන අතර[1 B] එසේ හඳුන්වා දෙනු ලබන බෝධිසත්ත්වවරුන් අතරින් අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ට ප්‍රධාන තැනක් හිමි වී ඇත.

මහායාන සම්ප්‍රදායට අනුව බුදුන් වහන්සේ සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය දේශනා කරන අවස්ථාවේ රැස් ව සිටි පිරිස ගැන එම සූත්‍රයේ නිදාන කථාවේ සඳහන් වේ. එහි සිටි බෝධිසත්ත්ව පිරිස අතර දෙවනුවට සඳහන් වන්නේ අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් පිළිබඳව ය.

ඉන්දියාව, චීනය, ශ්‍රී ලංකාව, කොරියාව, ජපානය, තිබ්බතය, වියට්නාමය, සිංගප්පූරුව යන රටවල අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව සංකල්පය හා බැඳුණු සංස්කෘතිය හෙවත් භක්ති මාර්ගය දේශාන්තර වශයෙන් විවිධ බලපෑම් ඔස්සේ විකාශයට භාජනය වී ඇති අතර, එකී බලපෑම් තුළින් එය විවිධාකාරයෙන් පෝෂණය ලබා ජන ජීවිතයට බද්ධ වී ඇත. මෙහි ප්‍රභවය හා විකාශය දෙස බලන විට විද්‍යමාන වන්නේ ශ්‍රී ලංකාවේ හා ජපානයේ යුග කිහිපයක දී ජන සමාජයේ චින්තනය පෝෂණය කරන්නට අවලෝකිතේශ්වර සංකල්පය හා බැඳුණු චින්තන දහරාව සමත් වී ඇති බවයි. විශේෂයෙන් ම ජපානයේ එහි විශාල ප්‍රවර්ධනයක් දක්නට ලැබේ.

---

(1 A) Bhikku Anālāyo, The Genesis of the Bodhisattva Ideal, Hanburg University Press, Germany 2010, p.11.

(1 B) ක්ෂිතිගර්භ, වජ්‍රපාණි, ව්‍යෝමගර්භ, අවලෝකිත, විෂ්කම්භ, මංජුඝෝෂ, සමන්තභද්‍ර, මෛත්‍රේය, යනු එම ප්‍රධාන බෝධිසත්ත්වවරු 8 දෙනා වෙති.
ධම්මාලෝක හිමි, ජම්බුගහපිටියේ, මංජු ශ්‍රී භාෂිත චිත්‍ර කර්ම ශාස්ත්‍ර සිංහල පරිවර්තනය, සමයවර්ධන, කොළඹ, 2012. p.124.

ජපානය තුළ අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණයත්, එම බෝධිසත්ත්ව දර්ශනය හා භක්ති මාර්ගය තුළින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමත්, සමස්ත ජන සමාජයේ ම එක් එක් චර්යාවන් හා අංශයන් කෙරෙහි එකිනෙකට වෙනස් ව එය සමාජගත වන ආකාරයත්, කළමනාකරණ පද්ධතීන් හා සුසංයෝග වන ආකාරයත් දැකිය හැකි වේ. විවිධ අර්ථ නිරූපණ හා විග්‍රහ කිරීම්වලට භාජනය වී ඇති ඇතැම් ජපන් කළමනාකරණ සිද්ධාන්තවල ප්‍රභව මූල මෙම ඇදහිල්ල ආශ්‍රිත චින්තනයෙන් සොයාගත හැකි බවත් පෙනේ.

පෙරදිග හා අපරදිග, ආසියා, අප්‍රිකා හා යුරෝපීය යන භේදයකින් තොරව සමස්ත ලෝකයට ම අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව චර්යාවේ පරමාදර්ශී චින්තනය කොතෙක් දුරට අදාල කරගත හැකි ද යන්නත් විමසිය හැකි ය.

ලෞකික හා ලෝකෝත්තර අංශයන් කෙරෙහි නැඹුරු වෙමින් වර්තමාන ලංකාවේ එහි නව ප්‍රවණතා කිහිපයක් උද්ගත වෙමින් පවතී. එබැවින් මෙම බෝධිසත්ත්ව දර්ශනය හා භක්ති මාර්ගය තුලනාත්මක ව අධ්‍යයනය කිරීමට සුදුසු කාලෝචිත මාතෘකාවක් සේ හැඟේ. මේ ආශ්‍රිත ව මෙතෙක් කර ඇති අධ්‍යයන රැසක් හමු වී ඇත. එස් වුවත් ඊටත් වඩා දුරට විහිදී යන තුලනාත්මක අධ්‍යයනයකින් අනාවරණය කරගත හැකි, කරුණු රැසක් ගැන අපට අවධානය යොමු කළ හැකි වීය.

**නිර්වචන විග්‍රහය**

අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් හැඳින්වීමට ඉන්දියාව, ශ්‍රී ලංකාව, චීනය, වියට්නාමය, කොරියාව, තිබ්බතය, ථායිලන්තය හා ජපානය වැනි රටවල විවිධ විශේෂ නාම භාවිත කොට ඇත.

මුලින් ම මෙම බෝසතුන් ගැන කියැවෙන සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ මෙතුමා 'අවලෝකිතේශ්වර' යනුවෙන් හඳුන්වා ඇත.[2 A]

---

(2 A) Saddharmapundkrika Suttram, with Mironou, N.D., Readings from Central Asian MSS. Revised by Dutt, Nalinaksha.
Asiatic Society Culcutta 1953.

ක්‍රි.ව. 3 වන සියවසේ සංඝවර්ම හා සංඝරක්ෂිත යන ආචාර්යවරු පරිවර්තනය කළ සද්ධර්මපුණ්ඩරීක සූත්‍ර පිටපත්වල ද 'අවලෝකිතේශ්වර' යනුවෙන් සඳහන් කර ඇත.[2B]

'ලෝකනාථ', 'ලෝකේශ්වර', 'ලෝකේශ්වරනාථ', සහ 'මහාකරුණා' යන නම් ද මෙම බෝධිසත්ත්වයන් හැඳින්වීමට භාවිත කර ඇත. මෙම බෝධිසත්ත්වයන්ගේ මුල් නම 'අවලෝකිතස්වර' බවත් පසු කලෙක 'අවලෝකිතේශ්වර' යනුවෙන් හැඳින් වූ බවත් ඒ පිළිබඳව ගවේෂණය කළ විද්වත්හු ප්‍රකාශ කරති.[3]

මධ්‍යම ආසියාවේ හා ථායිලන්තයේ 'ලෝකේශ්වර' යන නමින් ද චීනයේ 'kwan - shih - yin', 'guanyin' හා 'guanshiyin' යන නම්වලින් ද හඳුන්වා ඇත. චීනයේ මීට අමතරව තවත් නම් කිහිපයක් භාවිත කර ඇත. චීනයේ පළාත් අනුව ද නම්වල වෙනස්කම් දක්නට ලැබේ. චීනයේ භාවිත කරන පොදු නාමය guan - yin වුව ද ෂැංහයි ප්‍රාන්තයේ 'knoen' යනුවෙන් ද මැන්ඩරීන් භාෂාවෙන් zguanshi - in' හා 'kuan - shih - yin ' යනුවෙන් ද ව්‍යවහාර වේ. ප්‍රඥා පාරමිතා හෘදය සූත්‍රය 'ආර්යාවලෝකිතේශ්වර බෝධිසත්ත්ව, මහා සත්ත්ව' යනුවෙන් හඳුන්වා ඇත.

**(ආර්යාවලෝකිතේශ්වරො බෝධිසත්ත්වො මහාසත්ත්වෝ ආර්යාවලෝකිතේශ්වරො බෝධිසත්ත්වො ගාම්භීරායං ප්‍රඥා පාරමිතා යාං චර්යා ධර්මාතොවසවලෝක)**

ශාන්තිදේව පාදයන්ගේ බෝධිචර්යාවතාරයේ 'ආර්යාවලෝකිතේශ්වර' යනුවෙන් හඳුන්වා ඇත.[4] ශ්‍රී ලංකාවේ 'අවලෝකිතේශ්වර' හා 'අවලෝකිතේශ්වරනාථ' යන නම්වලින් හඳුන්වා ඇත.[5]

අෂ්ට දසසාහශ්‍රිකා හෙවත් මහා ප්‍රඥාපාරමිතා සූත්‍රයෙහි ප්‍රධාන බෝධිසත්ත්වවරු අතර අවලෝකිතේශ්වර ගැන සඳහන් වේ.[5 A]

---

(2 B) 'අවලෝකිතේශ්වරෝ බෝධිසත්ත්වෝ'.
Translations by Wogihara, U., & Tsuchida, C.,
Saddharmapundarika Suttram,
Romanized and revised text of the bibliothecha Buddhica Publications by consulting Sanskrit, Tibetan & Chinese. Tokyo, 1958, Chap. 24. (මෙය ජපන් ජාතිකයන් සඳහා වූ මුද්‍රණයකි.)

(2 B 1) ගුණපාල, ධර්මසිරි., සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය - සිංහල පරිවර්තනය, දෙහිවල. 2003. 25 පරි. 01 පි.

(2 B 2) Edkins. J., Chinese Buddhism London, 1880, P.382.

(3) සාසනරතන හිමි, මොරටුවේ., ලක්දිව මහායාන අදහස්, විසිදුනු, බොරලැස්ගමුව, 1999, 221 පි.

(4) එම. 221 පි. සහ Journal of the Royal Asiatic Society (JRAS), 1927, P.241.

(5) සාසනරතන හිමි, මොරටුවේ., ශාන්තිදේව පාදයන්ගේ බෝධිචර්යාවතාරය, සිංහල පරිවර්තනය, 186පි.

(5 A) විමලරතන නාහිමි, බෙල්ලන්විල., ප්‍රඥාපාරමිතා සාහිත්‍යය, බෞ. සං. ම. දෙහිවල, 2000, 42පි.